# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2019

-------------------------------------------------

## 1.1 මතය

-------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**
-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**
---------------------------------------

**1.6.1 ලැබිය යුතු මුදල්**
--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් තුළ ඇතුළත් අතිරේක සේවා සපයන ලද එයාවින් ගාර්ඩ් ආයතනයට ගෙවිය යුතු 2019 දෙසැම්බර් මාසයට අදාළ රු.147,119 ක මුදල 2020 මැයි 31 දක්වාම ගෙවා නොතිබුණි. | කළමනාකරණ තීරණ අනුව ඉදිරියේදී ගෙවීම් කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වියදම් නිසිපරිදි නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**
-------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | අවසන්වරට පුස්තකාල පොත් සමීක්ෂණය 2017 වර්ෂයේදී සිදුකර තිබුණු අතර එහිදී | මූලික පරීක්ෂණයක් සිදු කිරීමට කළමනාකරණ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 102,103 හා 104 හා 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | හෙළිදරව් වූ අස්ථානගතවී තිබූ පොත් 216 ක් හා ප්‍රකාශන 588 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය විසින් සිදුකර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | |
| (ii) මුදල් රෙගුලාසි 757(2) | 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයක් කර තිබූ අතර එහිදී හෙලිදරව් වූ රු.510,093 ක වටිනා භාණ්ඩ 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අංශ ප්‍රධානීන් කරුණු විමසා ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 15(2) වගන්තිය | නියමාවලිය අනුව ආයතනය විසින් පාරිසරික විද්‍යාව හා සමාජ විද්‍යාව යන එක් එක් අධ්‍යයන සභාවක බලතල, කාර්යය හා කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිමාවලිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.51,823,178 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.34,333,293 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,489,885 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ Notional Trust නැමැති පරිබාහිර ආයතනයේ කාර්යාලයක් පවත්වාගෙන යාම සහ ICOMASS නැමැති ආයතනයේ කාර්යාල ලිපිනය ලෙස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලිපිනය භාවිතා කරමින් එහි රැස්වීම් පැවැත්වීමට ආයතනයේ ශ්‍රවනාගාරය කිසිම ගාස්තුවක් ගෙවීමකින් තොරව භාවිතා | 2020 වර්ෂයේ සිට ආයතන දෙකෙහි සිදුවී ඇති සේවා සම්බන්ධ වාර්තා කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව. | ආයතනයට අවාසි නොවන පරිදි අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| කරගෙන යාම සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වාදීමෙන් පසු එම අදාළ ආයතන හා පශ්චාත් උපාධි ආයතනය විසින් අවබෝධතා ගිවිසුම් 02 ක් අත්සන් කර තිබුණි. ගිවිසුම් වලට එළඹීමේ දී කිසිම ගාස්තුවක් අය නොවන ආකාරයට හා ආයතන දෙකෙන් එකිනෙකට සේවා සැපයීම පිළිබඳ කොන්දේසි ඇතුළත් කර තිබුණ ද එම ආයතනවලින් ගිවිසුමේ සඳහන් සේවාවන් පශ්චාත් උපාධි ආයතනයට ලැබෙන බවට තහවුරු ලබාගැනීමට විගණනයේදී නොහැකි විය. | | |
| (ආ) ආයතනයේ පරිපාලන ගොඩනැගිල්ලේ සවිකර තිබූ පිරිවැය රු.55,000 ක්වූ ඇඟිලි සළකුණු යන්ත්‍රය 2019 මාර්තු 29 දින නැතිවී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමට විගණිත දිනය වූ 2020 මැයි 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. | එයාර්විත් ගාර්ඩ් පෝර්ස් සිකියුරිටි ක්ලීන් ඇන්ඩ් ජැනිටොරියල් සර්විස් පුද්ගලික සමාගමට ගෙවිය යුතු මුදලින් අඩුකර ගැනීමට තීරණය වී ඇත. | ආයතනයට සිදුවී ඇති පාඩුව අයකර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-----------------------** | **-----------------------** | **-------------** |
| (අ)මෙම ආයතනයේ පාඨමාලා සති අන්තයේ පැවැත්වෙන අතර ස්ථිර කාර්යමණ්ඩලය 09 දෙනෙකු හා 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා බාහිර කථිකාචාර්යවරු 6 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී තිබුණි. දේශන පැවැත්වීම පිළිබඳ නඩත්තු කරන ලේඛන පරීක්ෂාවේදී නියමිත වේලාවට දේශන නොපැවැත්වීම සම්බන්ධයෙන් වැඩබලන අධ්‍යක්ෂවරයා එම ලේඛනවල සටහන් කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී දේශන පැවැත්වීම පිළිබඳ පවත්වාගෙන යනු ලබන ලේඛනය නිසි අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙම තත්ත්වයන් අවම කිරීමට කටයුතු කරන බව. | දේශන පැවැත්වීම පිළිබඳව කළමනාකරණය විසින් නිසි අධීක්ෂණයක් පවත්වාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)ආයතනයේ පර්යේෂණ සහිත උපාධි පාඨමාලාවට අදාළව විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී නිබන්ධන ආයතනයට භාරදීමෙන් පසු පරීක්ෂකවරුන්ට භාරදීමට දින 60 කට වඩා ප්‍රමාද වීම. පළමු පරීක්ෂක සහ දෙවන පරීක්ෂක ලබාදීමෙන් පසු පරීක්ෂා කර නැවත ලබාදීමට මාස 03 කට අධික කාලයක් ගතවීම. වාචික පරීක්ෂණ සඳහා කැඳවීමට ප්‍රමාද වීම සහ සනාතන සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම වැනි කරුණු හේතු වී තිබූ බව අනාවරණය විය. | ඉදිරියේදී මෙම ප්‍රමාදයන් අවම කිරීම උදෙසා කටයුතු කරන බව. | ප්‍රමාදයකින් තොරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ---------------------- | ------------- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව අධ්‍යාපන ආයතන වැනි ව්‍යවස්ථාපිත ආයතන පනතේ අරමුණු අනුව හා දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු වුවද මෙම ආයතනය 2019 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2019 ක්‍රියාකාරී සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2020 දී කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන එයට අනුගතව කටයුතු කරන බව. | ඉලක්කගත අරමුණුවලට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කල යුතුය. |